පාර්ලිමේන්තු සැසි වාරය 76
විදේශ රැකියා අමාත්‍යාංශය

අට වැනි පාර්ලිමේන්තු තුන් වන සැසිවාරය
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවන වාර්තාව

කමිටුව මගින් සාකච්ඡා කරන ලද දුර්වලතාවයන් හා ලබා දුන් නියෝග	කමිටුව මගින් සාකච්ඡා කරන ලද දුර්වලතාවයන් හා ලබා දුන් නියෝග ක්‍රියාත්මක කල නිර්දේශ හා වර්තමාන තත්ත්වය
විදේශ රැකියා අමාත්‍යාංශයේ දැක්ම , මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්	කරුණාකර **ඇමුණුම** 01බලන්න
මැද පෙරදිග සුරක්ෂා ස්ථානවල රඳවා සිටින ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය විශාල ලෙස වැඩිවීම	සුරක්ෂා නිවාසයන්හි මේ වන විට සිටින විගමණික ශ්‍රමික සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් අවම වී ඇති අතර තානාපති කාර්යාල මඟින් ඔවුන්ගේ ගැටළු සඳහා කඩිනම් විසඳුම් ලබා දී නැවත ශ්‍රී ලංකාවට පිටත්කර හැරීමට කටයුතු කරමින් පවතී. මෙය සනාථ කිරීම සඳහා අවශ්‍ය සංඛ්‍යා දත්ත මේ සමඟ ඉදිරිපත් කරමි. 2017 වර්ෂයේ රැඳවුම් නිවාසයට වාර්තා වූ විගමණික ශ්‍රමික සංඛ්‍යාව 2423 2018 වර්ෂයේ රැඳවුම් නිවාසයට වාර්තා වූ විගමණික ශ්‍රමික සංඛ්‍යාව 2383 2019.01.01 දින සිට 2019.05.13 දින දක්වා රැඳවුම් නිවාසයට වාර්තා වූ විගමණික ශ්‍රමික සංඛ්‍යාව - 940 යම් හෙයකින් එක් කාන්තා ශ්‍රමිකයෙකුට වැඩි කාලයක් සුරක්ෂා නිවාසයේ රැඳී සිටීමට සිදුවනුයේ ඇයට අදාලව එරට අධිකරණයෙහි ක්‍රියාත්මක වන නඩු සඳහා ඇයගේ සහභාගිත්වය අනිවාර්ය වන බැවින් හා ඇයට එදිරිව එරට සේවා යෝජක විසින් ගමන් තහනම් කිරීම් නියෝගය (Travel Ban) පනවා තිබීම හේතුවෙනි.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයට හා අමාත්‍යාංශයට දිනපතා ලැබෙන පැමිණිලි / අභියචනා සංඛ්‍යා ප්‍රමාණයන් වැඩි අගයක් ගැනීම.	කාර්යාංශයට දිනපතා පැමිණෙන පැමිණිලි ලැබුණු වහාම පැමිණිලි කළමනාකරණ පද්ධතියේ (CMS) සියළු තොරතුරු සහිතව ඇතුලත් කරනු ලැබේ. එම තොරතුරු පැමිණිලි කළමනාකරණ පද්ධතියට ඇතුලත් කල වහාම අදාල තානාපති කාර්යාලයට, රැකියා ඒජන්සි ආයතනයන්ට හා කාර්යාංශයේ අදාළ නිලධාරීන් හට ලබාගත හැකිය. එසේම අදාල පාර්ශවයන් විසින් එම පැමිණිලි වලට අදාලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන එම ක්‍රියාමාර්ග එම පද්ධතියට ඇතුලත් කිරීම සිදු කරයි. ඒ අනුව, අදාළ පාර්ශවයන් විසින් ගනු ලබන පියවර අනුව කාර්යාංශයේ සමථ අංශය විසින් විසඳීම දක්වා කටයුතු කරනු ලැබේ. පරිගණක පද්ධතියෙන් ලබාගන්නා ලද 2018වර්ෂයට අදාල පැමිණිලි වර්ගීකරණය මේ සමඟ අමුණා ඇත. කරුණාකර **(ඇමුණුම 02 හා 03)** බලන්න
ශ්‍රී ලංකාවේ වසරකට අසාධු ලේඛනගත කරනු ලබන පෞද්ගලික විදේශ රැකියා ඒජන්සි ප්‍රමාණය හා අසාධු ලේඛනගත කරනු ලබන නිර්නායක	"අසාදු ලේඛණ" ගත කිරීම් යනුවෙන් වචන ප්‍රයෝජනයට ගත්තද එසේ අසාධු ලේඛණ ගත කිරීමට කාර්යාංශ පනතේ හෝ ප්‍රතිපාදන නොමැත. නමුත් පහත අවස්ථාවන් හිදී කාර්යාංශ පනතේ 39 වගන්තියේ ප්‍රතිපාදන පරිදි අනුමැතීන් අත්හිටුවීම සිදුකරන අතර එය ප්‍රදර්ශනය වනුයේ Bl ackl i st / Suspensi on යටතේ වේ. බලපත්‍රයක් අවලංගු කිරීමට කාර්යාංශ පනතේ 31 වගන්තියේ ප්‍රතිපාදන ඇත. අවලංගු කල බලපත්‍රයක් නැවත වලංගු කල හැකි එකම ක්‍රමය පනතේ 33 වගන්තිය යටතේ වන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය මතයි. එසේ බලාත්මක කිරීමට තීරණය නොවුන හොත් කිසිදා එකී බලපත්‍රය නැවත ප්‍රයෝජනයට ගත නොහැකි වේ. කාර්යාංශයේසභාපතිවරයාගේ චක්‍රලේඛයක් මත මිනිස් වෙළඳාමේ වරදට වරදකරුවන බලපත්‍රලාභියෙකුට හෝ ආයතනයකට එකී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හෝ බලපත්‍රලාභියාගේ පවුලේ අයෙක් බලපත්‍රයක් ඉල්ලීමට නුසුදුසු වන බවට වන දැනුම් දීමක් සියළුම බලපත්‍රලාභීන්ට කර ඇත. <u>සමථ අංශය</u> පැමිණිලි සමථකරණ කටයුතු කිරීමේදී කාර්යාංශ පනතෙහි 44(1) වගන්තිය අනුව කටයුතු කරනු ලැබේ. පැමිණිලි පරීක්ෂණයක් පැවැත්වීම, නියෝග ලබාදීම සහ නීත්‍යානුකූල ලියවිලි මඟින් අවශ්‍ය කටයුතු කිරීමෙන් අනතුරුව අදාල ගැටළුව විසඳීමට රැකියා ඒජන්සි ආයතනය මඟහරින්නේනම් එවැනි අවස්ථා වලදී එම දේශීය රැකියා ඒජන්සි ආයතනය හෝ විදේශ රැකියා ඒජන්සි ආයතනය ගැටළුව විසඳන තෙක් අසාධුලේඛණගත කිරීමට කටයුතු කරනු ලැබේ. කාර්යාංශ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව එම ගැටළු විසඳීම සඳහා කාර්යාංශයට රැකියා නියෝජිත ආයතන වෙත විධාන දීමේ බලය ඇති අතර එසේ විධාන දීමෙන් පසුවත් කටයුතු නොකරන්නේ නම් එම රැකියා නියෝජිත ආයතන වලට එරෙහිව නඩු පැවරීමේ හැකියාව ඇත.

	<u>විශේෂ විමර්ශන අංශය</u> **නිර්ණායක-** 1. පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන විමර්ශනයන් සඳහා සහභාගී නොවීම හේතුවෙන් විදේශ රැකියා ආයතනවල බලපත්‍රය තාවකාලිකව අසාධු ලේඛන ගත කර ඇත. 2. විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතට පටහැනිව ක්‍රියා කිරීම (කාර්යාංශ ලියාපදිංචි නොකර විදේශ ගත කිරීම්, අනුමත රැකියා ඇණවුම් නොමැතිවීම්, අනුමත ගාස්තුවට වැඩි මුදලක් අය කිරීම්) හේතුවෙන් විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා අදාළ විදේශ රැකියා ආයතන බලපත්‍රය තාවකාලිකව අසාධු ලේඛන ගත කිරීම. **<u>අනුමැති අංශය</u>** විදේශ රැකියා ආයතන අසාදු ලේඛනගත කිරීම අනුමැති අංශය විසින් සිදු නොකරයි. එහෙත් විදේශ රැකියා ආයතනයන්හි ක්‍රියාකලාපය සම්බන්ධව යම් ගැටළුවක් ඇතිවූ අවස්ථාවක රැකියා නියෝජිත ආයතනයේ අනුමැතීන් අත්හිටුවීමක් පමණක් මෙම ඒකකය විසින් කරනු ලබයි. **නිර්ණායක-** 1. දේශීය රැකියා ආයතන මඟින් විදේශගතවූ ශ්‍රමිකයින්ගෙන් කාර්යාංශයට ලැබෙන පැමිණිලි සම්බන්ධව සමථ අංශය මඟින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, එම පැමිණිලි විසඳීම සඳහා සෘජුව මැදිහත් විය යුත්තේ දේශීය රැකියා නියෝජිත ආයතනය බවට සමථ නිලධාරියා විසින් අදාල රැකියා ආයතනයට විධානය කිරීමෙන් පසුවද, එම ගැටළුව විසඳීමට රැකියා නියෝජිත ආයතනයේ ප්‍රමාණවත් සහයක් කාර්යාංශයට නොලැබෙන අවස්ථාවලදී, එම පැමිණිලි විසඳීම සඳහා දේශීය රැකියා නියෝජිත ආයතනයේ සක්‍රීය දායකත්වය ලබාදීමට පෙළඹවීම සඳහා අදාල රැකියා ආයතනයේ අනුමැතීන් තාවකාලිකව අත්හිටුවන අතර, අදාල ගැටළුව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගැනීමෙන් පසු අනුමැතීන් අත්හිටුවීම ඉවත් කරනු ලබයි. 2. විදේශගතවීමට නියමිත ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියාපදිංචි නොකර අයථා ක්‍රම මඟින් විදේශගත කිරීම හෝ ඊට තැත්කිරීම, ශ්‍රමිකයින් විදේශගත කිරීමට අදාල ලේඛන ව්‍යාජව සකස් කර කාර්යාංශයට ඉදිරිපත් කිරීම, විදේශගත වීමට නියමිත ශ්‍රමිකයින්හට මූල්‍ය වංචා සිදුකිරීම වැනි, පැමිණිලි සම්බන්ධව කාර්යාංශයේ නීති අංශය හා විශේෂ විමර්ශන අංශය මඟින් කරනු ලබන විමර්ශන වලින් විවිධ අක්‍රමිකතා සම්බන්ධව අදාල රැකියා ආයතන සෘජු මැදිහත්වීමක් ඇති බවට විමර්ශන නිලධාරීන් විසින් තහවුරු කරගත් පසු (අධිකරණමය ක්‍රියාමාර්ග ගතයුතු පැමිණිලි හැර),එම රැකියා ආයතනවල අනුමැතීන් තාවකාලිකව අත්හිටුවීම කරනු ලබන අතර, අදාල ගැටළුව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගැනීමෙන් පසු අනුමැතීන් අත්හිටුවීම ඉවත් කරනු ලබයි.

	3. විදේශ රටවල රැකියා නියෝජිත ආයතන වෙතින් කොමිස් මුදල් ලබාගෙන ශ්‍රමිකයන් එරටට ලබා නොදුන් බවට එම රටවල රැකියා නියෝජිත ආයතන විසින් ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට හෝ සෘජුවම කාර්යාංශය වෙත යොමු කරන පැමිණිලි සම්බන්ධව පරීක්ෂණයකින් අනතුරුව ඒ පිළිබඳ දේශීය රැකියා ආයතන චෝදනාවට ලක් වුව හොත් අදාල රැකියා ආයතනයේ අනුමැතීන් තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන අතර, ගැටළුව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගැනීමෙන් පසු අනුමැතීන් අත්හිටුවීම ඉවත් කරනු ලබයි. **මේ අනුව සමථ අංශය, විශේෂ විමර්ශන අංශය හා අනුමැති අංශයන් විසින් අංශයන්ගේ රාජකාරි කටයුතු සිදුකිරීමේදී උක්ත නිර්ණායකයන් මත පසුගිය වර්ෂ 08ක කාලය තුලදී අනුමැතීන් තාවකාලිකව අත්හිටවූ ප්‍රමාණයන් පහත පරිදි වේ.** 2012 - 140 2013 - 223 2014 - 186 2015 - 180 2016 - 61 2017 - 116 2018 - 89 2019 - 44 (මැයි මස 15 දක්වා)
අමාත්‍යාංශය විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ඩබල් කැබ් රථ 05 ක් ප්‍රසම්පාදනය කර මාස 10 ක කුලිය ලෙස 2017 වර්ෂයේ රු 7,956,850.00 ක් ගෙවා නිබීම	ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කාර්යය මණ්ඩලයේ පරිහරණය සඳහා එතුමාගේ ඉල්ලීම පරිදි සහ භාණ්ඩාගාර අනුමැතිය මත මෙහෙයුම් කල්බදු ක්‍රමයට ඩබල් කැබ් රථ 05 ක් ලබාගන්නා ලදී. නියෝජ්‍ය ඇමතිතුමාගේ තනතුර අහෝසි වීම නිසා මෙම වාහන අතිරික්ත බව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත දන්වන ලදී. තවද විදේශ සේවා නියුක්ති කාර්යාංශයට නව වාහන සපයා ගැනීමේ අවශ්‍යතාවයක් පවතින නිසා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අදාල සැපයුම්කරු සමඟ ඉදිරි ගිවිසුම් කාලය සඳහා ගිවිසුම්ගත වීමට මේ සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස සභාපතිවරයා විසින් එකඟතාවය පළ කර ඇත.ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

මෙම වැඩසටහනෙහි 2014 වර්ෂයේ දී ආරම්භ කල දෙවන අදියරට ස්විට්සර්ලන්ත රජයෙන් ඇ ඩොලර් 3,875,000/- ක අධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලැබිය යුතු වුව ද දැනට රාජ්‍ය නොවන සංවිධානයක් හරහා ලැබීම පිළිබඳ කාරක සභාව සිය අවධානය යොමු කලේ ය. මෙය අදියර කිහිපයක් යටතේ සිදු වන අතර පළමු අදියරට අමාත්‍යාංශය හරහා නොමැතිව ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග සෘජුවම අරමුදල් ලබා දී ඇති බව හා දෙවන අදියරේ දී අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමේ දී එහි පැහැදිලිව සඳහන් වී ඇත්තේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා අරමුදල් ලබා දිය යුතු බව වුවත් ගිවිසුමේ දී එම කොන්දේසිය ඉවත් කර තිබීම මත නැවතත් පෙර පරිදිම සෘජුවම අරමුදල් ලබා දී ඇති බව ප්‍ර.ග.නි පැවසී ය. කෙසේ වුව ද මෙහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය ලබා ගෙන මෙම ක්‍රියාවලිය අමාත්‍යාංශයේ ව්‍යාපෘති උපදේශන කමිටුව මගින් 2017 හා 2018 වර්ෂවලදී අධීක්ෂණය කරමින් පවතින බව ද ප්‍ර.ග.නි වැඩිදුරටත් පැවසී ය. මේ පිළිබඳ අමාත්‍ය වරයා දැනුවත් කර අමාත්‍ය මණ්ඩලයට දන්වන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නියෝග කලේ ය.	මේ පිළිබඳව අමාත්‍යවරයා දැනුවත් කර අමාත්‍ය මණ්ඩල සටහනක් අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලදී. ඒ අනුව අමාත්‍ය මණ්ඩල සටහන මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණ සමග සලකා බලන ලදුව සටහනේ සඳහන් කරුණු සැලකිල්ලට ගන්නා ලද බැව් අංක අමප/19/0297/130/008 හා 2019 පෙබරවාරි මස 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් කර ඇත. අමාත්‍ය මණ්ඩල සටහනෙහි හා තීරණයන්හි පිටපත් මේ සමග අමුණා ඇත. කරුණාකර **ඇමුණුම 04**බලන්න

2016 නොවැම්බර් 09 දිනැති අංක අපම /16/2048/741/011 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රජයේ කඩිනම් සහන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කල යුතු විගමණික සේවකයන් සඳහා වූ විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාල පනත. මෙය 2018 අගෝස්තු 30 දින වන විටත් අනුමැතිය සඳහා ඉදිරිපත් කර නීතිපති දෙපාර්තමේන්තුවේ පැවතීම හා භෞතික හා මූල්‍ය ප්‍රගතිය.	කරුණාකර ඇමුණුම 05බලන්න
මේ පිළිබඳ මුල් අවස්ථාවේ දී අවශ්‍ය පූර්ව ඇගයීම් සිදු කිරීමට පියවර ගැනීමේ දුර්වලතාවය කාරක සභාවේ අප්‍රසාදයට ලක් විය. මේ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුණු බවත් මෙම වසර අවසානයට පෙර මෙම දත්ත පද්ධතිය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍ර.ග.නි පැවසී ය.	විගමනික ශ්‍රමිකයන් පිළිබඳ පවුල් පැතිකඩ නිර්මාණය කිරීමට අදාළ තොරතුරු පරිගණක ගත කර දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (I LO) මූල්‍ය ආධාර මත, දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා සේවා සපයන ආයතනයක් වෙත ලබා දී ඇත. එම ආයතනය විසින් මේ වන විට අදාල නිලධාරීන් සමග සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති අතර මෙම වසරෙහි සැප්තැම්බර් මාසය තුල අදාල දත්ත පද්ධතියෙහි කටයුතු අවසන් කර ලබා දීමට කටයුතු කරන බවට අදාල ආයතනය විසින් එකඟතාවය පළකර ඇත.

2012 වර්ෂයේදී රජයේ තක්සේරු විසින් රු.2,800,000 කට තක්සේරු කර තිබූ රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුවේ අනුමැතියද ලද අමාත්‍යාංශයට අයත් වාහනය 2014 වර්ෂය සඳහා අපහරණය කර නොතිබූ අතර නැවත අභ්‍යන්තර කමිටුවක් විසින් රු.400,000.00 කට තක්සේරු කර රු.1,274,900 කට විකිණුවද වාහනයේ ලියාපදිංචි සහතිකය නොමැතිවීම නිසා ගැණුම්කරු වෙත ආපසු මුදල් ගෙවා තිබුණි. පසුව අපහරණ ක්‍රියාවලිය අවධිමත්ව කර තිබුණු අතර ඒ සඳහා වන පුවත්පත් දැන්වීම් වෙනුවෙන් අවස්ථා දෙකකදී රු.170,526 ක් දරා තිබීම හා ලියාපදිංචි සහතික පිටපත් ලබාගෙන 2018 ජූලි 20 දින රු.1,365,367 කට විකිණීම	2012 වර්ෂයේ රජයේ තක්සේරු කරුගේ වාර්තාව 2018 වන විට කල් ඉකුත්ව ඇති බැවින් 2014 සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාහන තක්සේරු මණ්ඩලයේ වාර්තාවට අනුව තක්සේරුව සැලකිල්ලට ගෙන 2018 ජූලි 20 දින තක්සේරු අගයට වැඩි අගය වූ රු.1,365,367 කට ප්‍රසිද්ධ ලංසු කැඳවීමේ ක්‍රියාවලිය අනුව වාහනය අලෙවිකර ඇත. මේ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ උපදෙස් පරිදි මුල්‍ය වංචාවක් සිදු වී ඇද්ද යන්න පරීක්ෂා කිරීම සඳහා විමර්ශනයක් සිදුකරන ලදී.අදාල විමර්ශන වාර්තාවේනිගමන අනුව ඊට සම්බන්ධ පුද්ගලයන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට ලේකම්තුමාගේ අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. තවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කලද එය ඔවුන්ට අදාල කාර්යයක් නොවන බව දන්වා ඒ පිළිබඳ කොටුව පොලීසියට පැමිණිලි කරන ලෙස දන්වා ඇත. ඒ අනුව කොටුව පොලිස් ස්ථානයට පැමිණිලි කර ඇත. කරුණාකර **ඇමුණුම 06**බලන්න

ගරු ඇමතිතුමනි,
නිර්දේශ කර අත්සනට ඉදිරිපත් කරමි.

ඩබ්.ඒ.චූලානන්ද පෙරේරා
ලේකම්

හරීන් ප්‍රනාන්දු (පා.ම)
විදුලි සංදේශ ,විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය